# මිහින්තලය පුවරසන්කුලම පුරාවිද්‍යා පරිශ්‍රයේ පුරාවිද්‍යා වටිනාකම පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

පි.එන්.එම්.සමරතුංග

පුරාවිද්‍යා හා උරුම කළමණාකරන අධ්‍යයන අංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
niroshasamarathunga933@gmail.com

ප්‍රමුඛ පදඃ මෙහෙණි ආරාම, නටඹුන්, ක්ෂේත්‍රයේ, පුරාවිද්‍යාත්මක සාධක

## හැඳින්වීම

ලක්දිවට බුදු දහම ගෙන එන ලද්දේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා සියවස් දෙකකට පමණ පසුවය. මිහිදු මහ රහතන් වහන්සේ විසින් ලක්දිවට බුදුදහම හඳුන්වා දීමෙන් පසුව ලක්දිව යුව රජුගේ බිසොව වූ අනුලා දේවිය ඇතුළු පන්සීයයන් කාන්තාවෝ පැවිදි වීමට කැමැතිබව කියා සිටි හෙයින් ලක්දිව භික්ෂණී ශාසනය පිහිටුවා ගැනීම සඳහා මිහිදු හිමියන්ගේ ගිහි ජීවිතයේ දි නැගණියන් වූ සංඝමිත්තා තෙරණියන් වහන්සේ දිවයිනට ගෙන්වා ගනු ලැබුවාය. (මව.xv:20) ලක්දිව භික්ෂුණී ශාසනය පිහිටුවීම සහ ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව වැඩම කරවීම සඟමිත් තෙරණියගෙන් සිදු වූ වැදගත් කාර්ය ද්වයය විය. සඟමිත් තෙරණිය අනුලා බිසව ඇතුළු පන්සීයයක් කාන්තාවෝ ද අන්තඃපුරවාසි කාන්තාවෝ ද දහස් ගණන් මහණ කරවා, අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා සංඛ්‍යාත ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මවා සර්වඥ ශාසනය වර්ධනය කළ බව සිංහල බෝධිවංසයේ දැක්වේ(මුණසිංහ, 2008).කාන්තාවන් දහස් ගණනින් පැවදිවීම නිසා ලක්දිව මෙහෙණී සස්න විශාල ලෙස පැතිරෙන්නට විය. මෙසේ පැවිදි වූ කාන්තාවන් අතර රාජ මෙහෙසියෝ සහ රාජ මාතාවෝද ඇතුළත් වූහ.එයට සාධක වංසකතාවලින් ම ලැබේ.භික්ෂුණී ශාසනයේ වර්ධනයත් සමඟ භික්ෂු හා භික්ෂුණීන් වෙත එකට වැඩ සිටීමට නොහැකි හෙයින් රාජ අනුග්‍රහයන් යටතේ භික්ෂුණීන් වෙත භික්ෂුණී ආවාසයන් නිර්මාණය කර දෙනු ලැබීය. භික්ෂුණීන් සඳහා ද මෙහෙණවර පූජා කිරීමේ ආරම්භය දේවානම්පියතිස්ස රජ්‍ය සමය ( ක්‍රි.පු 250-210) දක්වා ම දිවයයි. භික්ෂුණීන්ගේ උපෝසථ පාවරණ ආදි සංඝ කර්මයන් සඳහා හත්ථාළ්හක මෙහෙණවරෙහි බද්ධ සීමා බදින ලද බව මහාවංසයේ දැක්වේ. මහාවංසයේ සඳහන් පරිදි ක්‍රි. ව 266 ට ආසන්න කිලයේ දී මහසෙන් රජු (ක්‍රි.ව 276-303) විසින් මෙහෙණ වරක් කළ බව සඳහන් වේ.එය වර්තමාන පංකුලිය ලෙස හඳුනාගනී (මුණසිංහ, 2008).

භික්ෂුණී ආරාම පිළිබඳ මෙවැනි සාහිත්‍යාත්මක කරුණු පුරාවිද්‍යාත්මකව සනාත වන වටිනා ස්ථානයක් ලෙස පුවරසන්කුලම පෙන්වාදීමට පුළුවන. ස්ථානගත වීම විමසා බැලීමේ දී උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලා ප්‍රාදේශිය කොට්ඨාශයේ වසංමලේ ග්‍රාමසේවා වසමේ පුවරසන්කුලම ග්‍රාමයෙහි පුරාවිද්‍යා පරිශ්‍රය පිහිටා ඇත. දකුණේ සිට උතුරට විහිදෙන ගල් තලාවක් මත අක්කර හතරක භූමි භාගයක් පුරා මෙම ක්ෂේත්‍රයේ විහිදිම පෙන්වාදීමට පුළුවන. මෙම පුරාවිද්‍යා පරිශ්‍රය පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයවල තොරතුරු අල්ප හෙයින් ජනප්‍රවාදවලට අනුව ලංකාවේ ප්‍රථම භික්ෂුණීය වූ අනුලා දේවිය ඇතුළු

අනෙකුත් භික්ෂුණීන් වහන්සේලා පැවිදිව වැඩ වාසය කළ විහාරස්ථානය ලෙස ද මෙය සැලකේ. පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථානයක් ලෙස හඳුන්වාදිය හැකි මෙම ස්ථානයෙහි ස්ථූපයක්, ගිරි ලිපියක්, හා විවිධ වාස්තුවිද්‍යාත්මක සාධක මෙන්ම පොකුණක් දැකගත හැකිය. නිසි ප්‍රතිසංස්කරණයට ලක් නොවූ හා ජනතාවගේ අවම සැලකීම මත මෙම පුරාවිද්‍යාත්මක ස්ථානය පිරිහීමට පත්ව ඇති අතර වර්තමානය වන විට මෙහි අවම දත්ත ප්‍රමාණයක් දක්නට ලැබේ. එම දත්ත නිරීක්ෂණය කරමින් මෙම ස්ථානයෙහි පවතින පුරාවිද්‍යාත්මක වැදගත්කම අනාවරණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

**ක්‍රමවේදය**

පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු බිම්කඩක් වූ පුවරසන්කුලම පිළිබඳ අධ්‍යනයේ දී සාහිත්‍ය මූලාශ්‍රය ගවේෂණය, ක්ෂෙත්‍ර ගවේෂණය, සම්මුඛ සාකච්ඡා හා මිනුම් ලබාගැනීම, අන්තර්ජාලය පරිශීලනය මාර්ගයෙන් තොරතුරු ඒකරාශි කර ගැනීම සිදුකරන ලදි.

**ප්‍රතිඵල හා සාකච්ඡා**

19 වැනි සියවසට අයත් පුරාවිද්‍යා වාර්තාවල අනුරාධපුරයේ පුවරසන්කුලම නමින් ගම් දෙකක් වාර්තා වී ඇත. එකක් අනුරාධපුර පූජා නගරයේ සිට උතුරු දෙසින් පිහිටි අතර අනෙක නම් මිහින්තලයට සැතපුම් දෙකක් පමණ උතුරෙන් වූ ස්ථානයකි. (නිකලස්, 1979 :188) එච්.සී.පී. බෙල්ගේ වාර්ෂික පුරාවිද්‍යා වාර්තා මෙම ස්ථාන දෙකටම අයත් තොරතුරු වෙන් වෙන් ව වාර්තා කර ඇත. (ASCAR, 1900:12) ඒ අනුව මිහින්තලය අසල ඇති පුවරසන්කුලමෙහි දාගැබක්, ගිරි ලිපියක්, හා විවිධ වාස්තුවිද්‍යාත්මක සාධක පැරණි වාර්තාවල සඳහන් කර තිබෙන අතර, එම සාධක අද ද එම ස්ථානයෙන් දැකගත හැකි වේ.

ස්තූපයේ පවතින වැදගත්කම විමසා බැලීමේදී මෙය නිර්මාණය කර ඇත්තේ උතුරු දකුණු දිශානුගතව විහිදෙන ස්වභාවික ගල් තලාවක් මතය. ගල් තලාවේ ආරම්භයේ ,එනම් දකුණේ සිට මීටර් 246 ගිය තැන ස්තූපය නිර්මාණය කර ඇත. ස්තූපයේ උතුරු දකුණු දිශානුගත ප්‍රධාන ප්‍රවේශ දොරටු දෙකකි. ප්‍රධාන ගල් තලාව මධ්‍යයෙහි පහත් භූමිය උස්කොට වේදිකාවක් තනා ස්තූපය නිර්මාණය කර තිබේ. ස්තූපයේ විශ්කම්භය මීටර් 118 වේ. ප්‍රවේශ දොරටුවේ පළල මීටර් 15 වන අතර දිග ප්‍රමාණය මීටර් 25 කි. ස්තූපය වටා සකසා ඇති වේදිකාව ස්තූපයේ සිට මීටර් 6ක් පළල වේ. ස්තූපයේ නිර්මාණ ලක්ෂණවලට අනුව මෙය සංරක්ෂණය කලහොත් විශාලත්වයෙන් අනුරාධපුර මිහින්තලේ පූජානගරයට පිටතින් දැකගත හැකි ස්තූප අතර මෙය විශාල ස්තූපයක් ලෙස හඳුනාගත හැකිය. මෙයට සමාන ස්තූප ලෙස කටියාව නාවාගල, පලාගල උපුල්වෙහෙර, නා වෙහෙර ආදි ස්තූපයන් හා ප්‍රමාණයෙන් සමාන වනවා සේම සමකාලීන නිර්මාණ ලෙස පෙන්වාදීමට පුළුවන.

ගිරිලිපිය පිළිබඳ ව විමසා බැලීමේ දී මෙය දිගින් මීටර් 4.20 ද පළලින් මීටර් 4.20 ප්‍රමාණයෙන් යුක්තවේ. මෙය කනිට්ඨතිස්ස රජ පරපුරට අයත් ගිරි ලිපියක් ලෙසත්, එම ගිරි ලිපියට අනුව එම ස්ථානය අනුලතිස්ස පර්වත විහාරය වශයෙන් පසුකාලයේ දී හඳුනාගෙන ඇත.(හෙට්ටිආරච්චි, 2013:12) මෙම ගිරි ලිපිය පිළිබඳව වැඩි දුරටත් අධ්‍යයන සිදු කර නොමැත.

මෙම පුරාවිද්‍යාත්මක ස්ථානයේ පවතින ගොඩනැගිලි පිළිබඳ ව කරුණු අනාවරණය කිරීමේ දී මේවායෙහි පිහිටීම ස්තූපයේ සිට මීටර් 38 උතුරු දෙසට

ගමන්කල විට පළමු වැනි ගොඩනැගිල්ල හමු වේ. මෙය ස්තූපයට නැගෙනහිර දෙසින් නිර්මාණය කර ඇත. මෙහි පළල මීටර් 14 .70 වන අතර දිග ප්‍රමාණය මීටර් 11 වේ. එමෙන්ම පොකුණට බටහිරින් තවත් ගොඩනැගිල්ලක් පිහිටා ඇති අතර එය මීටර් 8ක් හා පළල මීටර් 11 වේ. එම ගොඩනැගිල්ලේ සිට උතුරු දෙසට ගමන් කළ විට තවත් ගොඩනැගිලි සාධක හමු වේ. මතුපිට සාධක අනුව මේවා නිර්මාණය කර ඇත්තේ ගල් තලාව මත කනු පාදම් ගල් යොදා කැටගල් පුරවා භූමිය සකස් කර ය. මේවා ප්‍රමාණයෙන් තරමක් විශාල ඒවා බවත් මෙම ක්ෂේත්‍රය පුරා ආරාම සංකීර්ණයක ලක්ෂණ ගොඩනැගිලි අවශේෂ තුළින් හඳුනාගැනීමට පුළුවන.

ක්ෂේත්‍රයෙහි දක්නට ලැබෙන තවත් වැදගත් අංගයක් ලෙස පොකුණ පෙන්වා දීමට පුළුවන. මෙය ස්තූපයේ සිට මීටර 58 දුරින් නිර්මාණය කර ඇත.ස්වභාවික ගල් තලාවෙහි බැස්ම උපකාරයෙන් මීටර දෙකක පමණ උස් බැම්මක් බැද පොකුණ සකසා තිබේ. පොකුණේ උපරිම දිග ප්‍රමාණය මීටර 22 වේ.

භික්ෂුණී ආරාමයක් ලෙසින් හඳුනාගත හැකි පුවරසංකුලම අනුලාදේවි චෛත්‍ය වර්තමානය වන විට බෙහෙවින් විනාශයට පත් වී ඇති බව හඳුනාගත හැකිය. ලංකාවේ මේවන විට භික්ෂුණී ආරාම පිළිබඳව සාධක පවතින්නේ අල්ප වශයෙනි. එවැනි වැදගත් පුරාවාද්‍යාත්මක සාධක හමුවන භික්ෂුණී ආරාමයක් වන මෙහි චෛත්‍ය හා ගොඩනැගිලි ආදි ස්මාරක නෂ්ටාවශේෂ බවට පත් වී ඇති අතර ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, හා ආගමික මෙන් ම ලේඛන කලාව පිළිබඳ සාධක සපයන මෙම ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමෙන් අතීත මෙහෙණී ආරාම පිළිබඳ තොරතුරුද ඒවායේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ ද මතු පරපුරට සුරක්ෂිත කළ හැකිය. විනාශයට පත්ව ඇති අගයන් ආරක්ෂාකර ඉදිරියට පවත්වාගෙන යාම උදෙසා මෙම ස්මාරක අදාළ ආයතන හා පුද්ගලයන්ගේ මැදිහත්වීම මගින් විධිමත් පරිදි හඳුනාගනිමින් වාර්තාගතකර ඉදිරි සංරක්ෂණ කාර්යයන්වලට යොමු කිරීම් කළ යුතු බව දැක්විය හැකිය.එම නිසා මෙම ස්ථානය සතු පුරාවිද්‍යාත්මක වටිනාකම තහවුරු කිරීම මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ

හෙට්ටිආරච්චි, කේ., සමරනායක, ජී., අබේනායක,අයි. (2013)*පුවරසන්කුලම ඓතිහාසික චේතියගිරි විහාරය.*නාවින්නඃතරංජී ප්‍රින්ටර්ස් .

මුණසිංහ, අයි. (2008)*පැරණි ලක්දිව භික්ෂුණී ශාසනය.* බත්තරමුල්ලඃ ජයසිංහ ප්‍රින්ටර්ස්.